මාධ්‍යයක් මගින් යම් පුවතක් ඉදිරිපත් කිරීමේදී එහි නිරවද්‍යභාවය පවත්වා ගැනීමට සෑම සියළු උත්සාහයක්ම ගැනීම, ආචාර ධාර්මික මාධ්‍යකරණයයි. එහිදී යම් කිසි මූලාශ්‍රයක් මගින් තොරතුරු ලබාදී ඇති විටකදී පවා, බහුමූලාශ්‍ර පරිශීලනය කර එම තොරතුරු තහවුරු කර ගැනීම ඔස්සේ පුවතේත් අදාළ මාධ්‍යයේත් විශ්වසනීයත්වය ඉහළ යයි.

"දකුණු ආසියාවේ අඩුම ඉන්ධන මිල තිබෙන්නේ ශ්‍රී ලංකාවේ -තෙල් සංස්ථාවේ සභාපති" යන සිරස්තලයෙන් යුතුව දිනමිණ පුවත්පතේ (පෙබරවාරි 1, 2022) පළවූ පුවත් වාර්තාවක් මෙහිදී විමසුමට ගත හැක. වැඩිදුරටත් මෙම පුවත් අන්තර්ගතයේ සඳහන් වන්නේ, ඉන්දියාවේ ඉන්ධන මිල ශ්‍රී ලංකාවේ මෙන් දෙගුණයක් බවත්, ඉන්ධන නිෂ්පාදනය කරන පකිස්තානයේ ඉන්ධන මිල ශ්‍රී ලංකාවට වඩා අඩු වන්නේ ශත ගණනකින් බවත් වේ.

කෙසේ නමුත්, විවිධ රටවල ඉන්ධන මිල ගණන් ඉදිරිපත් කරන GlobalPetrolPrices.com වෙබ් අඩවියේ දත්ත පරිශීලනය කොට බැලූ විට පෙනී යන්නේ, ඩීසල් සම්බන්ධයෙන් කලාපයේ අඩුම මිල ශ්‍රී ලංකාව සතුවූවද, පෙට්‍රල් සම්බන්ධයෙන් බැලූ විට පාකිස්තානය සහ ඇෆ්ගනිස්තානය ශ්‍රී ලංකාවට වඩා අඩු මිලකට පෙට්‍රල් ලබාදෙන බවයි.

1) "පකිස්තානයේ ඉන්ධන මිල ශත ගණනකින් පමණක් ශ්‍රී ලංකාවට වඩා අඩු" බව පුවත් අන්තර්ගතයේ සඳහන් වන විට, "දකුණු ආසියාවේ අඩුම ඉන්ධන මිල තිබෙන්නේ ශ්‍රී ලංකාවේ" යනුවෙන් යොදා ඇති සිරස්තලය නොමඟ යවන සුළු යැයි ඔබ නොසිතන්නේ ද?

2) GlobalPetrolPrices.com වෙබ් අඩවියේ දත්ත අනුව බැලූ විටද, ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල සම්බන්ධයෙන් තෙල් සංස්ථාවේ සභාපතිවරයා පවසන කරුණ අර්ධ සත්‍යයක් නොවන්නේ ද?

3) දිනමිණ පුවත්පත වාර්තා කර ඇත්තේ තෙල් සංස්ථාවේ සභාපතිවරයා පවසන කරුණ වුවත්, එය තවත් මූලාශ්‍රයක් ඔස්සේ පරීක්ෂා කොට නිරවද්‍යභාවය තහවුරු කරගැනීම වඩාත් යෝග්‍ය නොවේද?

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://www.globalpetrolprices.com/diesel_prices/
https://www.globalpetrolprices.com/gasoline_prices/

කලාපයේ ඉන්ධන මිල පිළිබඳව මින් පෙර FactCheck.lk විසින් කළ විශ්ලේෂණයකට

පිවිසුම මෙතැනින්:
http://factcheck.lk/claim/ramesh-pathirana-3